# විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
## (බාහිර) - 2009

### සමාජීය විද්‍යා පීඨය

### සංචාරණය සහ සංස්කෘතික සම්පත් කළමනාකරණය TCRM - E1025

### සංචාරණයේ ඉතිහාසය

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න</u>

<u>ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න සහ ලබා දී ඇති පැවරුම් මාතෘකා දෙකෙන් එකකට අදාළ ප්‍රමාණවත් පැවරුමක් කරන්න. පරීක්ෂණයට පෙනී සිටි දිනයේ සිට මාසයක කාලයක් ඇතුළත එය භාරදිය යුතුවේ.</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි　　　　　　　　　　කාලය : පැය 03 යි

---

01. ආගමික අරමුණු කේන්ද්‍ර කරගත් සංචාරණය පැරණි ලෝකයේ බොහෝ ශිෂ්ටාචාරවල ජනප්‍රියව පැවතුණි. මෙම ප්‍රකාශය සනාථ කරමින් කරුණු ඉදිරිපත් කරන්න.

02. අතීත ශ්‍රී ලංකාවේ සංස්කෘතික සංචාරණයේ ඉතිහාසය පිළිබඳව සාකච්ඡා කරන්න.

03. කාර්මික විප්ලවයෙන් පසුව ලෝකය තුළ ඇති වූ සමාජ හා ආර්ථික වෙනස්වීම් සංචාරක කර්මාන්තය වර්ධනය සඳහා බලපෑ ආකාරය විමර්ශනය කරන්න.

04. (අ) ලෝක සංචාරක සංවිධානයේ ආරම්භය පිළිබඳව සඳහන් කර

(ආ) එහි අරමුණු හා ක්‍රියාකාරකම් වර්තමාන ලෝකයේ සංචාරක කටයුතුවල සංවර්ධනය කෙරෙහි දක්වන දායකත්වය සම්බන්ධයෙන් ඔබේ අදහස් ඉදිරිපත් කරන්න.

05. (අ) ශ්‍රී ලංකාවේ නූතන සංචාරක කටයුතුවල ආරම්භය හා විකාශනය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය හා සම්බන්ධ ප්‍රධාන රාජ්‍ය ආයතනවල කාර්යභාරය ප්‍රමාණය කරන්න.

06. (අ) 20 වන සියවසේ දෙවන භාගයේ හා 21 වන සියවසේ මුල් කාලයේ දී වරින්වර ලෝක සංචාරක ව්‍යාපාරයේ සිදුවූ අපගමනයන් කෙරෙහි හේතුවූ කරුණු මොනවාද?

(ආ) එම කරුණු සංචාරණය කෙරෙහි ඇති කළ බලපෑම සාකච්ඡා කරන්න.

07. (අ) ත්‍රාසජනක සංචාරණය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ආ) ත්‍රාසජනක සංචාරණයේ (Adventure Tourism) ඉතිහාසය එහි නව ප්‍රවණතා කෙරෙහි විශේෂ අවධානයකින් යුක්තව සාකච්ඡා කරන්න.

08. සංචාරක කර්මාන්තයේ මෑත කාලීන ඉතිහාසය තුළ ඒ සමග බැඳුණු සාමාජීය හා සංස්කෘතික ගැටළු ද පැහැදිලිව හඳුනාගත හැකිය. එම ගැටළු හා ඒවා නිරාකරණය කිරීම සඳහා ඔබ ඉදිරිපත් කරන යෝජනා පැහැදිලි කරන්න

පහත සඳහන් මාතෘකාවලින් එකක් සඳහා ප්‍රමාණවත් පැවරුමක් කරන්න.

1. "ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ නව ප්‍රවණතා"

2. "පැරණි ඉන්දියාවේ සංස්කෘතික සංචාරණ කටයුතු"